පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-137/2014

මගේ අංකය : ECE/DS/EL/2014/VI

සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
2014.09.20.

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම විමධ්‍යගත ඒකක ප්‍රධානින් හා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති විශේෂිත ව්‍යාපාර වල ප්‍රධානින්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,
පළාත් ආරෝගය ශාලාවල සියළුම වෛද්‍ය අධිකාරීවරු,
මූලික රෝහල් වල සියළුම දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන්,
සියළුම ආයතන ප්‍රධානින්,

## විශේෂඥ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා 2015 වසර තුළදි විදේශ ගතවීම් සඳහා උපයාගත නිවාඩු ලබා දීම.

2015 වසර තුළදි උපයාගත් නිවාඩුව ලබා ගැනිමට සුදුසුකම් ලබන හා උපයාගත් නිවාඩුව ලබා ගැනිමට අදහස් කොට ගෙන සිටින දන්ත ශල්‍ය වෛද්‍යවරුන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛය සමඟ යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව අයදුම්පත් සකස් කළ යුතුවන අතර නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2014.10.15 දින හෝ ඊට පෙර "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්," සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. යන ලිපිනයට යොමු කළ යුතුය. තවද මෙම චක්‍රලේඛයට යා කොට ඇති අයදුම්පත සමඟ පොදු 126 පෝරමයද නිසි පරිදි අයදුම්කරු විසින් සම්පූර්ණ කර ආයතන ප්‍රධානින්ගේ නිර්දේශය ද සමඟ අදාළ අයදුම්පතක් යොමු කළ යුතු බවට මින් අවධාරණය කරනු ලැබේ. අදාළ අයදුම්පතෙහි පිටපතක් ද නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දන්ත වෛද්‍ය සේවා), සෞඛ්‍ය සේවා දෙපාර්තුමේතුව, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට 2014.10.15 දිනට ප්‍රථම එවීම ද සිදුකළ යුතුවේ.

මේ වන තෙක් ලබා ගෙන ඇති විදේශ නිවාඩු වලට අදාළ තොරතුරු එනම්, විවේක නිවාඩු, අඩ වැටුප්, වැටුප් සහිත, වැටුප් රහිත හෝ අධිශිෂ්‍යත්ව/අනුග්‍රහකත්ව යනාදියද අයදුම්පතට ඇතුළත් කළ යුතුවේ .

උපයාගත් නිවාඩු ප්‍රදානය කිරිම ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 17 වන වගන්තියට අදාළව දක්වා ඇති විධිවිධාන වලට යටත්ව සිදුකෙරෙනු ඇත.

උපයගත් නිවාඩු ප්‍රදානය කිරීමට එකඟතාවය ලබා දෙමින් එවනු ලබන ලිපිය ලැබී සති 03ක කාලයක් තුළ අදාළ උපයාගත් නිවාඩු ලබාගන්නේද නැද්ද යන බැව් මෙම නිවාඩු ලබාදීමට තෝරා ගනු ලැබූ නිලධාරීන් විසින් මා වෙත දැනුම් දිය යුතුවේ.

නිවාඩු පිළිගන්නේ ද යන වග නොදැන්වීම හෝ මෙම නිවාඩු පිළිනොගැනීම අදාළ ලැයිස්තුවේ සිටින මීළඟට වඩාත් සුදුසුකම් සහිත නිලධාරීන් වෙත එම අවස්ථාව ලබා දීමට හේතුවනු ඇත.

තෝරා ගනු ලැබූ යම් නිලධාරියකු විසින් අදාළ නිශ්චිත කාල පරිච්ඡේදය තුළ තම උපයාගත් නිවාඩු ලබා නොගතහොත්, එළඹෙන වසර 02ක කාලය සඳහා උපයාගත් නිවාඩු ලබා ගැනීමට හිමිකම් කීමට අදාළ නිලධාරියාට නොහැකි වනු ඇත.

තෝරාගනු ලබන නිලධාරීන් 2015.06.30 දිනට ප්‍රථම දිවයිනෙන් බැහැර යෑම සඳහා යෝජිත නිවාඩු යොදාගෙන දිවයිනෙන් අදාළ විදේශ රට වෙත යායුතුය. අදාළ තෝරාගනු ලැබූ නිලධාරී විසින් තමන් වෙත පිරිනමනු මෙම නිවාඩු ලබාගන්නේද? නැද්ද? යනවග අවසරය ලැබී සති 03 ඇතුළත මා වෙත දැනුම් දීම කළයුතු අතර, සහ 2015.06.30 දිනට පෙර දිවයිනෙන් බැහැර යාමට අපොහොසත් වුවහොත් එම නිලධාරියා හට ඊළඟ වසර 02ක කාලයක් සඳහා උපයාගත් නිවාඩු ලබා දීමට සළකා නොබලනු ඇත.

සුදුසුකම් සහිත නිලධාරීන්ගේ අවධානයට මෙම චක්‍රලේඛනයේ අන්තර්ගත කරුණු නිරාවරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

වෛද්‍ය පී.ජී.මහිපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත -: ගරු ලේකම්, රාජ්‍ය සේවා දන්ත වෛද්‍ය සේවා සංගමය.